**පන්විල ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන.**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

---------------------------------

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 05 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

------------

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

--------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.**

----------------------

**බලපත්‍ර ගාස්තු ගිණුම් තැබීමේ දී, ඉකුත් වර්ෂයේ දී මුදල් පදනම භාවිතා කර සමාලෝචිත වර්ෂයේ දී, උපචිත පදනම භාවිතා කිරීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවලට සිදු වන බලපෑම මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.**

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.**

**------------------------**

(අ) අංක **252-6544** දරන ඩබල් කැබ් රථය අලුත්වැඩියාව සඳහා මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන අමාත්‍යාංශය ප්‍රතිපාදන මත රු.**1,131,988** ක් වැය කර තිබුණි. මෙම වාහනය අලුත්වැඩියා කිරීම හේතුවෙන්, සිදු වූ එකතු වටිනාකම තක්සේරු කර, ගිණුම්වලින් ගැළපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.**74,716** ක් වූ කර්මාන්ත ණයගැතියන් විවිධ ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**---------------------------------**

(අ) ලැබියයුතු ගිණුම්.

**--------------------**

**2013** දෙසැම්බර් **31** දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතුව රු.**8,830,313** ක් වූ අතර, එයින් අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.**1,961,567** ක් විය. එම ශේෂයෙන් **2014** ඔක්තෝබර් **30** දිනට රු.**1,961,567** ක් තවදුරටත් ලැබියයුතුව තිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්.

**----------------------**

**2013** දෙසැම්බර් **31** දිනට එකතුව රු.**10,707,844** ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂ තුළ අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී වටිනාකම රු.**3,313,032** ක් විය. එම ශේෂයෙන් **2014** ඔක්තෝබර් **30** දිනට රු.**2,734,098** ක් තවදුරටත් ගෙවියයුතුව පැවතුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**---------------------------------**

**අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.18,677,958 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**1.3.5 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම්.**

**------------------------------------------------**

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අනුව අය කරනු ලබන මුද්දර ගාස්තු කාර්තුව අවසන ඊට පසු මාසයේ 15 දින හෝ ඊට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත්, රු.23,546 ක් 2009 වර්ෂයේ සිට තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**----------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,170,877 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.532,115 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.638,762 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**----------------------------------**

**මුළු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 1.3:1 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුපාතය 1.2:1 ක් වුයෙන්, සභාවේ ද්‍රවශීලතාව යහපත් තත්ත්වයක නොපැවතින.**

**2.3** ආදායම් පරිපාලනය.

**2.3.1** වරිපනම් බදු

වර්ෂය ආරම්භයේ හිග හිටි මුදලින් සියයට **60** ක් අය කර තිබූ අතර**,** ආරම්භක හිග ශේෂයෙන් රු**.3,065** ක් කපා හැර තිබුණි**. 2013** දෙසැම්බර් **31** දිනට රු**.486,391** ක හිගයක් නිරීක්ෂණය වූ අතර**,** එම හිගයෙන් **2014** සැප්තැම්බර් **30** දින වන විට රු**.220,275** ක් තවදුරටත් අය වියයුතුව තිබුණි**.**

**2.3.2** බදු කුළී.

**2013** ආරම්භයේ දි රු**.66,337** ක හිග ශේෂයක් වූ අතර**,** සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම අධි ගාස්තු සමග රු**.452,620** ක් විය**.** ඉන් වර්ෂය තුළ අය කර ගැනීම පිළිවෙළින් සියයට **41** ක් හා සියයට **87** ක් වූ අතර**,** වර්ෂය අවසාන හිගය රු**.97,469** ක් විය**.** මෙම හිගයෙන් **2014** සැප්තැම්බර් **30** දින වන විට රු**.41,299** ක් තවදුරටත් අය වියයුතුව තිබුණි**.**

**2.3.3** ජල ගාස්තු.

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු**.212,140** ක හිගයක් පැවති අතර**,** වර්ෂය තුළ බිල් කිරීම රු**.594,525** ක් විය**.** ඉන් වර්ෂය තුළ අය කිරීමේ ප්‍රතිශතය පිළිවෙළින් සියයට **80** ක් හා සියයට **73** ක් විය**.** අය කිරිම් පමා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ හිගයෙන් රු**.18,959** ක් කපා හැර තිබූ අතර**,** වර්ෂය අවසානයේ හිගය රු**.180,884** ක් විය**.** එම හිගයෙන් **2014** සැප්තැම්බර් **30** දිනට රු**.39,315** ක් තවදුරටත් අය වියයුතුව තිබුණි**.**

**2.3.4** අක්කර බදු.

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිගය රු**.41,410** ක් වූ අතර**,** වර්ෂය තුළ බිල් කිරීම අධි ගාස්තු සමග රු**.41,155** ක් විය**.** එම ආදායම් අය කර ගැනීමේ ප්‍රතිශතය

පිළිවෙළින් සියයට **18** ක් හා සියයට **57** ක් විය. අය කිරීම් පමා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ ආරම්භක හිග මුදලින් රු.**17,356** ක් වර්ෂය තුළ කපා හැර තිබුණු අතර, ආරම්භක හිග මුදලින් **2014** සැප්තැම්බර් **30** දිනට රු.**26,545** ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

**2.3.5** මස් කඩ, මාළු කඩ, බදු

-------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිග ශේෂය රු.**33,446** ක් වූ අතර, වර්ෂයේ බිල් කිරිම් අධි ගාස්තු සමග රු.**572,960** ක් විය. ඉන් වර්ෂය තුළ රැස් කළ ආදායම පිළිවෙළින් රු.**30,846** ක් හා රු.**536,418** ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට **92** ක් හා සියයට **94** ක් විය.

**2.3.6** ත්‍රී රෝද රථ, බයිසිකල් ලියාපදිංචි ගාස්තු.

--------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිග ශේෂය සහ ඉකුත් වර්ෂයේ අවසාන හිග ශේෂය ගිණුම් තුළින් හෙළිදරව් කර නොතිබූ අතර, මුදල් පදනම මත රු.**244,002** ක් වර්ෂය තුළ දී බිල් කර, ආදායම් රැස් කර තිබුණි. අදාළ ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර, නඩත්තු කර නොතිබූ අතර, වාර්තා කර තිබූ තොරතුරු අනුව බිල් කළයුතු ආදායම, නැවතුම් ගාස්තු හා ස්ටිකර් සඳහා පිළිවෙළින් රු.**177,800** ක් හා රු.**20,300** ක් ඇතුළුව එකතුව රු.**198,100** ක් විය.

**2.3.7** උසාවි දඩ හා මුද්දර ගාස්තු.

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් **2013** දෙසැම්බර් **31** දිනට පිළිවෙළින් රු.**88,000** ක් හා රු.**500,000** ක් ලැබියයුතු තිබුණු අතර, එම හිගයෙන් **2014** සැප්තැම්බර් **30** දින වන විට පිළිවෙළින් රු.**88,000** ක් හා රු.**387,450** ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

**2.3.8** **ප්‍රචාරන දැන්වීම් පුවරු ගාස්තු**

---------------------------------

**2013 ජනවාරි 04 දිනැති අංක 1972 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථානගත කර තිබූ දැන්වීම් පුවරු සඳහා රු.118,800 ක් වූ ගාස්තු 2013 වර්ෂයේ දි අය කර නොතිබුණි.**

**2.3.9** **සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු**

------------------------------

**(අ)** **සම්ප්‍රේෂණ කුළුණු මගින් සන්නිවේදන පහසුකම් සපයා තිබූ සමාගම්වලින් වාර්ෂිකව ව්‍යාපාර බදු අය කර ගතයුතු වුව ද, සමාගම් 06 කින් එසේ අය කර නොතිබුණි. පසුගිය වර්ෂ 03 ක කාලය තුළ දි සභාවට අය වීමට තිබූ ආදායම රු.72,000 ක් ඉක්මවා තිබුණි.**

**(ආ)** **සභා බල ප්‍රදේශය තුළ ඉදි කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 08 න් 05 ක් අනවසර ඉදි කිරීම් බව භෞතික පරීක්ෂාවේ දි අනාවරණය විය.**

**3.** **මෙහෙයුම් සමාලෝචනය.**

-----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

----------------------------------

**සභාවේ සේවය කළ සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවීමට තිබුණු දායක මුදල් නොගෙවීම හේතුවෙන්, 2013 දෙසැම්බර් 31 දිනට හිගව තිබූ මුදල රු.574,267 ක් විය.**

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

-----------------------------

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** **ගෘහස්ථ ජල සැපයුම් මගින් ව්‍යාපාර සඳහා ජලය ලබා දි තිබූ ස්ථාන 44 ක් සභා බල ප්‍රදේශය තුළ ස්ථාන 03 ක දි හඳුනා ගැණුනු අතර, ජල**

පාරිභෝගිකයින් සඳහා ජල මනු සකස් කර විධිමත් ආකාරයකින් ගාස්තු අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) අතුරු ව්‍යවස්ථාව අනුව, ත්‍රී රෝද රථ ලියාපදිංචිය විධිමත් කිරීමට හා අපහසුතාවයන් මග හරවා ගෙන ආදායම් රැස් කිරීමට අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හා නවාතැන් ගන්නා ස්ථාන 02 ක් හදුනා ගෙන තිබුණි. ඉන් රු.86,927 ක් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් 2013 වර්ෂයේ දි සභාව මගින් අය කර තිබුණ ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු නිවැරදිව ගණනය කර නොතිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

-------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,910,575 ක වටිනාකමක් වූ වත්කම් විෂයයන් 03 ක් නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතින.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය.

----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉදි කිරීම් අඩුපාඩු හේතුවෙන්, ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබු රු.1,961,567 ක මුදලක් කර්මාන්ත ණයගැතියන් තුළ 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) ඉටු කළ කර්මාන්තවල අඩුපාඩු හේතුවෙන්, බාහිර අමාත්‍යාංශවලින් මුදල් ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබු රු.2,610,914 ක් ණයහිමියන් ලෙස 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) පශු සම්පත් අමාත්‍යාංශය මගින් සභාව වෙත ප්‍රේෂණය කර, කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබූ කර්මාන්ත දෙකකට අදාළ රු.6,223,545 ක් වූ මුදලින් එම ඉදි කිරීම්වල අඩුපාඩු හේතුවෙන්, රු.1,765,254 ක් එම අමාත්‍යාංශය විසින් සභාවෙන් නැවත ඉල්ලා තිබුණි. මෙම සාවද්‍ය ගෙවීම් අදාළ වගකිවයුත්තන්ගෙන් අය කර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

---

**4.1 සංයුක්ත සැළැස්ම.**

සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි රු.16,495,430 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණු නමුත්, ඒ සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 ක්‍රියාකාරී සැළැස්ම.**

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබීම හේතුවෙන්, කාර්තුමය ප්‍රගති සමාලෝචනයක් සිදු කළ බවට වාර්තා ද විගණනයට ඉදිරිපත් නොවුණි.

**4.4 අභ්‍යන්තර විගණනය.**

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.5 අයවැය පාලනය.**

**------------------**

**සමාලෝචිත වර්ෂයේ සභාව මගින් පිළියෙළ කර තිබූ අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු හා තථ්‍ය ආදායම් හා වියදම් සැසඳීමේ දි , ආදායම් විෂයයන් 04 ක සියයට 07 සිට සියයට 46 දක්වා ද වියදම් විෂයයන් 07 ක සියයට 05 සිට සියයට 62 දක්වා ද විචලනයන් පැවතුණි.**

**5. පද්ධති හා පාලන.**

**--------------------**

**පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය.**

**(ආ) අභ්‍යන්තර පාලනය.**

**(ඇ) ආදායම් පරිපාලනය**

**(ඈ) ණයගැති හා ණයහිමි පාලනය.**

**(ඉ) වත්කම් කළමනාකරණය**

**(ඊ) තොග පාලනය.**

**(උ) කොන්ත්‍රාත් පාලනය**